# පියසටහන්

කතාව සහ නිර්මාණය: පූර්ණිමා මීගම්මන

චිත්‍ර: ප්‍රභාෂණ හස්තිධර

# ඩිජිටල් පියසටහන්

## හැඳින්වීම

අපට අවශ්‍ය වුවත් නැතත්, දිනපතාම පාහේ අපි බොහෝ දෙනෙක් අන්තර්ජාලය හරහා අප ගැන වැඩෙන ප්‍රතිරූපයකට දායක වනමුත්, ඒ ප්‍රතිරූපය අප සිතනවාටත් වඩා ප්‍රසිද්ධ එකකි.

අන්තර්ජාලයේ සැරිසැරීමෙන් පසු ඔබ එහි දමා යන සියල්ල ඩිජිටල් පියසටහන් යනුවෙන් හැඳින්වේ. සමාජ මාධ්‍ය, ස්කයිප් ඇමතුම්, යෙදුම් භාවිතය සහ විද්‍යුත් පණිවිඩ වාර්තා ද ඔබගේ අන්තර්ජාල ඉතිහාසයේ කොටසක් වන අතර, ඒවා අනෙක් පුද්ගලයින්ට ද දැකිය හැකිය.

මේවා වෙළෙඳ ආයතනවලට ඔබේ රුචිකත්වයට අනුව දැන්වීම් ඉදිරිපත් කිරීමට සහ සේවායෝජකයන්ට ඔබේ පසුබිම සොයා බැලීමට ද උපකාර කරයි. ඔබ අන්තර්ජාලයේ කරන ඕනෑම දෙයක් ඩිජිටල් පියසටහන්වලට ඇතුළත් වීමේ හැකියාවක් තිබේ.

https://www.internetsociety.org/tutorials/your-digital-footprint-matters/


ලියුමක් ඇවිත්?
පුතා හොදට පාස් වෙලා.
හුරේ!
O/L
ලැප්ටොප් එකක්?
මේක තමා හොදම තෑග්ග.


දැන් බලන්න
Register
COMMENT
POST
SHARE
ඔහු දිගටම අන්තර්ජාලයේ නරක පිය සටහන් ඉතිරි කළා.


ශිෂ්‍ය නායක බැජ් එකට අයදුම් කරාද?
ඔව්. මට සම්මුඛ පරීක්ෂණය හෙට.
HEAD PREFECT


මේ මගේ ලොකු හීනයක්.
අපි දැනුම් දීමක් කරන්නම්.
හරිම හොද CV එකක්.
බොහොම ස්තූතියි!
අද හොදම කෙනා.
මමත් එයාට කැමතී.
ඒත්...
මම එයාව සර්ච් කරල බැලුවා. හරිම නරක දේවල් දාල තියනවා.
එහෙනම් අපිට එයාව ශිෂ්‍ය නායක කරන්න බෑ නේ.
ඔව් ඒක ඉස්කොලෙට හරි නෑ..
මෙනුරට ශිෂ්‍ය නායක කම නැති උනා, එයා අන්තර්ජාලයට එල නරක දේවල් නිසා.
ඔබ අන්තර්ජාලයට එකතු කරන දේ සදාකල් පවතී.

# උගත් පාඩම්

## ඩිජිටල් පියසටහන් කළමනාකරණය

- ඔබේ අනන්‍යතාව රැකගන්න, පරිස්සමෙන් හා ගෞරවාන්විතව අදහස් ඉදිරිපත් කරන්න.
- ඔබේ රහස්‍යතා සැකසුම් පරීක්ෂා කිරීමට වගබලාගන්න.
- ඔබ සතුව තිබෙන ගිණුම්වල ලැයිස්තුවක් තබාගනිමින්, ඔබ තවදුරටත් භාවිතා නොකරන ගිණුම් මකා දමන්න.
- ඔබේ තොරතුරු සඳහා සොයාගත හැක්කේ කාටද යන්න ගැන අවධානයෙන් සිටින්න.
- ඔබ ගැන Google හරහා සොයා බලන්න - ඔබට ලැබෙන ප්‍රතිඵල ඔබව පුදුමයට පත්කරනු ඇත.
- ඔබ පණිවිඩයක් යවන විට හෝ පින්තූරයක් පළකරන සෑම අවස්ථාවකම එය අන්තර්ජාලයේ සදහටම පවතින බව මතක තබා ගන්න.
- Trace my shadow - myshadow.org වැනි ඩිජිටල් මෙවලම් භාවිතා කරමින් ඔබගේ ඩිජිටල් පියසටහන් කළමනාකරණය කළ හැක.